ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකː 2477424, 2477423, 2477311
ෆැක්ස්ː 2346257, 2477739
ඊ-මේල්ː dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියː www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017 නොවැම්බර් මස 06 වැනි දින |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවල සඳහන් සේවා නියුක්තිය සම්බන්ධ දත්ත පිළිබඳ පැහැදිලි කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2014, 2015 සහ 2016 යන වාර්ෂික වාර්තාවල සඳහන් සේවා නියුක්තිය පිළිබඳ දත්ත සම්බන්ධව විවිධ ජනමාධ්‍ය මගින් වාර්තා නිකුත් කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව නිරීක්ෂණය කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් මුළු දිවයින ම ආවරණය වන පරිදි පැවැත් වූ 2012 ජන හා නිවාස සංගණනයට පසු, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ප්‍රකාශයට පත් කර තිබූ මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු සංශෝධනය කර, එම සංශෝධිත දත්ත ශ්‍රේණිය නැවත ප්‍රකාශයට පත් කළේය. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රම බලකා සමීක්ෂණයට අදාළ ඇස්තමේන්තු නැවත බර තබන ලද අතර, 2016 ජූලි මාසයේ දී 2011 වසරේ සිට ඉදිරි කාලපරිච්ඡේදය සඳහා නව ශ්‍රම බලකා ඇස්තමේන්තු ශ්‍රේණියක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙය ශ්‍රම බලකා සමීක්ෂණ ඇස්තමේන්තු හා මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු අතර වන අනුකූලත්වය තහවුරු කිරීම සඳහා අනෙකුත් රටවල් ද අනුගමනය කරන පොදු ක්‍රියාමාර්ගයකි.

(www.statistics.gov.lk/samplesurvey/Labour%20force%20Survey%20%trends%20web.pdf සහ www.statistics.gov.lk/samplesurvey/Re-weightingLFS.pdf)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, නැවත බර තබන ලද ශ්‍රම බලකා ඇස්තමේන්තුවලට අනුකූලව 2016 වාර්ෂික වාර්තාවේ "සේවා නියුක්තිය" පිළිබඳ දත්ත ඇතුළත් කරන ලදී.

ඒ අනුව, ශ්‍රම බලකා ඇස්තමේන්තු සම්බන්ධයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනවල අඩංගු තොරතුරුවලට අමතරව 2013 සිට ඉදිරි කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක දත්ත ශ්‍රේණියක් ශ්‍රී ලංකා මහ බැංකුවේ 2016 වාර්ෂික වාර්තාවේ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයේ සංඛ්‍යා සටහන් අංක 56 සහ 57 මගින් පරිශීලනය කළ හැකිය.

මහජනතාවගේ දැන ගැනීම පිණිස, නැවත බර තැබීමට පෙර සහ නැවත බර තැබීමට පසු, ශ්‍රම බලකා ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු පහත ඉදිරිපත් කර ඇත.

## ශ්‍රම බලකා උපනති - නැවත බර තැබීමට පෙර සහ පසු ශ්‍රම බලකා ඇස්තමේන්තු

| වර්ෂය | සේවා නියුක්තිය (පුද්ගලයන් '000) | | සේවා නියුක්ති අනුපාතිකය (%) | | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (%) | | සේවා වියුක්ති අනුපාතිකය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | පෙර | පසු | පෙර | පසු | පෙර | පසු | පෙර | පසු |
| 2011 | 8,186 | 7,592 | 95.8 | 95.8 | 53.0 | 52.9 | 4.2 | 4.2 |
| 2012 | 8,118 | 7,489 | 96.0 | 96.0 | 52.6 | 52.5 | 4.0 | 4.0 |
| 2013 | 8,418 | 7,681 | 95.6 | 95.6 | 53.8 | 53.7 | 4.4 | 4.4 |
| 2014 | 8,424 | 7,700 | 95.7 | 95.7 | 53.3 | 53.2 | 4.3 | 4.3 |
| 2015 | 8,554 | 7,831 | 95.3 | 95.3 | 53.8 | 53.8 | 4.7 | 4.7 |
| 2016 | ලැනො. | 7,948 | ලැනො. | 95.6 | ලැනො. | 53.8 | ලැනො. | 4.4 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව